# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/26 - 2023 දෙසැම්බර් මස 20 වැනි බදාදා - 2023.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

22 වන වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්,

i. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළ කරන ලද, 2021 අංක 3 දරන නියෝගවල (මෙහි මින්මතු ''2021 අංක 3 දරන නියෝග'' වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයේ I කොටසෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, එ.ජ.ඩො. 50,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

ii. 2021 අංක 3 දරන නියෝගවල දක්වා ඇති පොදු අවසරය යටතේ, මෙම නියමයෙහි දිනය දක්වා, සංක්‍රමණික දීමනාවට දැනටමත් හිමිකම් පාන ලද විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සියරට යැවීම, එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

iii. 2021 අංක 3 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික සහ වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු වෙනුවෙන් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ විදේශ විනිමය නිකුත් කිරීම, එක් පුද්ගලයෙකු සඳහා එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

iv. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/37 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළ කරන ලද, 2021 අංක 4 දරන නියෝගවල උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ, වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරන ශ්‍රී ලංකාව තුළ නේවාසික ඕනෑම පුද්ගලයෙකු වෙනුවෙන් විදේශ විනිමය නිකුත් කිරීම එක් පුද්ගලයෙකු සඳහා එ.ජ.ඩො. 10,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

v. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/34 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළ කරන ලද, 2021 අංක 1 දරන නියෝගවල (මෙහි මින්මතු ''2021 අංක 1 දරන නියෝග'' වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා පහත අවශ්‍යතාවයන් ඉටු වන බවට ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වන ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටුවනු ලැබේ.

(අ) පනතේ විධිවිධාන යටතේ ආයාජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන, හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්, හෝ

(ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි), හෝ

(ඈ) සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ, හෝ

(ඉ) පහත සඳහන් සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් ඔවුන්ගේ විදේශයන්හි ඇති ප්‍රධාන ව්‍යාපාර ප්‍රසාරණය කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් පිටත ඇති සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම;

(i) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්: එ.ජ.ඩො. 200,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක සීමාවක් දක්වා, හෝ

(ii) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොකළ සමාගම්: එ.ජ.ඩො. 100,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක සීමාවක් දක්වා.

(ඊ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද සමාගම් විසින්, විදේශීය කාර්යාල පිහිටුවීම සඳහා එ.ජ.ඩො. 100,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක සීමාවක් දක්වා සිදු කරන ආයෝජන, හෝ

(උ) සුදුසුකම්ලත් නේවාසික පුද්ගලයකු විසින් සේවක කොටස් හිමිකම් සැලැස්මක්/සේවක කොටස් වරණීය ක්‍රමයක් යටතේ කොටස්වල කරන ආයෝජන.

vi. විදේශයන්හි ප්‍රධාන ව්‍යාපාර කටයුතු ප්‍රසාරණය කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 100,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

vii. ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

viii. 2021 අංක 1 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවලදී, එක් එක් ආයෝජනය මත පදනම්ව, පනතෙහි 7(10) වගන්තිය ප්‍රකාරව අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

(අ) පනතෙහි විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම, හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජනය සිදු කිරීම.

2. මෙම නියෝගයෙහි කාර්යය සඳහා ''ප්‍රධාන ව්‍යාපාර'' යන්නෙන් සමාගමේ විගණකවරයා විසින් තහවුරු කරන ලද පරිදි, සමාගමක ප්‍රධාන ආදායම් මූලාශ්‍රය ලෙස සැළකිය හැකි ව්‍යාපාරික ක්‍රියාකාරකමක් අදහස් වේ.

3. 2023 ජූනි මස 28 දිනැති අංක 2338/40 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළකරන ලද නියමයෙහි අංක (i) සහ (ii) ඡේදයන් යටතේ සංක්‍රමණික දීමනාවට දැනටමත් හිමිකම් පාන ලද විගාමිකයන් සඳහා මෙම නියමය යටතේ යළි සංක්‍රමණික දීමනාවට හිමිකම් කීම සඳහා අවසර නොලැබේ.

4. 2023 ජූනි මස 28 දිනැති අංක 2338/40 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළකරන ලද නියමයෙහි අංක (iii) සහ (iv) ඡේදයන් යටතේ ප්‍රතිමුඛ ප්‍රේෂණයන් දැනටමත් සිදුකර ඇති කිසිදු පුද්ගලයකුට මෙම නියමය යටතේ යළි ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදුකිරීම සඳහා අවසර නොලැබේ.

5. 2023 ජූනි මස 28 දිනැති අංක 2338/40 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළකරන ලද නියමයෙහි අංක (v), (vi) සහ (vii) ඡේදයන් යටතේ ප්‍රතිමුඛ ප්‍රේෂණයන් දැනටමත් සිදුකර ඇති ඕනෑම සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයෙකුට, එකී නියමය සහ මෙම නියමය යටතේ සිදු කරන ලද/ සිදු කරනු ලබන බාහිර ප්‍රේෂණවල සමුච්චිත එකතුව එකී නියමයෙහි දක්වා ඇති උපරිම සීමාවන් නොඉක්මවීමට යටත්ව මෙම නියමය යටතේ ප්‍රේෂණ සිදුකිරීමට අවසර ලැබේ.

6. මෙම නියමය, මෙම නියමයෙහි දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ. 2023 ජූනි මස 28 දිනැති අංක 2338/40 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළ කරන ලද නියමය ඉහත 5 ඡේදයෙහි දක්වා ඇති කරුණට අගතියක් නොවන පරිදි මෙමගින් අවලංගු කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0312

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.